# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2474/22 - 2026 පෙබරවාරි මස 03 වැනි අඟහරුවාදා - 2026.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (2ඇ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත මඩ කකුළු වගා ව්‍යාපෘතිය - කරෙයිනගර් දූපත, යාපනය දිස්ත්‍රික්කය

**පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව (EIAR)**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව, යාපනය, තනන්කිලප්පු, මන්නාරම අධිවේගී මාර්ගය, නාවන්තිකුලි හි පිහිටි පෙනින්සියුලා කොකෝ පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද, යාපනය දිස්ත්‍රික්කයේ, කරෙයිනගර් දූපතේ යෝජිත මඩ කකුළු වගා ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව (EIAR) මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2026.02.03 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

01. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10.
02. මධ්‍යම පරිසර අධිකාරිය, අංක 104, "පරිසර පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
03. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, බත්තරමුල්ල.
04. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කරෙයිනගර්.
05. ප්‍රාදේශීය සභාව, කරෙයිනගර්.
06. මධ්‍යම පරිසර අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, යාපනය.
07. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, යාපනය.
08. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව (උතුරු පළාත් කාර්යාලය), යාපනය.
09. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාලය, කච්චේරිය, යාපනය.

1A - G 46220 — 23 (2026/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මීට අමතරව, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

තව ද, මෙම යෝජිත ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳව පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස්, 2026.02.03 දින සිට දින 30ක් (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර) ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

මහාචාර්ය **පී. බී. ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල, මාලිගාවත්ත,
කොළඹ 10.

දුරකථන අංක : 011 2449197, 011 2449754, 011 2387922
ෆැක්ස් අංක : 011 2438005, 0112472623
ඊ මේල් : dg.ccd.lk@gmail.com

EOG 02 - 0020

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.